# නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් ඩෙබිට් මාස්ටර්කාඩ් කාඩ්පත්හි කොන්දේසි හා නියමයන්

වැදගත් :- නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී එල් සී (බැංකුවෙන්) ලබා දී ඇති මෙහි අන්තර්ගත කාඩ්පත අත්සන් කිරීමට හෝ භාවිත කිරීමට පෙර කරුණාකර කාඩ්පත් දරන්නාගේ ගිවිසුම ප්‍රවේශමෙන් කියවා බලන්න. කාඩ්පත භාරගැනීමෙන් සහ/හෝ අත්සන් කිරීමෙන් සහ/හෝ භාවිත කිරීමෙන් පහත සඳහන් කොන්දේසි හා නියමයන් ඔබ විසින් පිළිගනු ලබන අතර ඔබ එම කොන්දේසි හා නියමයන් වලින් බැඳී සිටී.

1. අර්ථ නිරූපන :

(අ) "ගිණුම්" යන්නෙන් කාඩ්පත වලංගු ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසුකම් ලැබීමට ගිණුම් හිමියාගේ ඉල්ලීම මත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් නම් කර ඇති ප්‍රාථමික ගිණුම ඇතුළු නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි පුද්ගලයන් විසින් දරනු ලබන ඉතිරි කිරීම් සහ/හෝ ජංගම ගිණුම් අදහස් වේ.

(ආ) ගිණුම්හිමියා - යන්නෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සමග ගිණුමක් දරා සිටින පුද්ගලයෙකු අදහස් වේ.

(ඇ) ගිණුම් ප්‍රකාශය - යන්නෙන් (කාඩ්පත භාවිත කරමින් සිදු කරන ලද ගනුදෙනු ඇතුළු) සිදු කරන ලද ගනුදෙනු සඳහන් කරමින්ද එම දිනයේ දී ගිණුමේ ශේෂය සඳහන් කරමින්ද නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ඇතුළත් කිරීමට සුදුසු යයි සළකනු ලබන වෙනත් තොරතුරු ඇතුළත් කරමින්ද නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් ගිණුම් හිමියාට යවනු ලබන කාලීන ගිණුම් ප්‍රකාශය/ප්‍රකාශන අදහස් වේ.

(ඉ) ඒ ටී එම් - යන්නෙන් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය අදහස් වේ. කොන්දේසි හා නියමයන්වලට අනුව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයට කරනු ලබන යම් සඳහන් කිරීමකට කාඩ්පත භාවිත කිරීම හරහා ක්‍රියාත්මක කරනු ලබන ජාලයක කොටසක් වන්නාවූද කාඩ්පත නිකුත් කළ රට තුළ හෝ ඉන්පිටත යම් සමාන යන්ත්‍රයක්ද අදහස් වේ.

(ඊ) බැංකුව - යන්නෙන් නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී එල් සී බැංකුව සහ එහි අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභින් අදහස් වේ.

(උ) කාඩ්පත - යන්නෙන් නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී එල් සී බැංකුව විසින් නිකුත් කරනු ලබන නේෂනස් ට්‍රස්ට් බැංකුවේ ප්ලැටිනම් ඩෙබිට් මාස්ටර්කාඩ් කාඩ්පත් සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ වර්ල්ඩ් මාස්ටර්කාඩ් කාඩ්පත් අදහස් වේ.

(ඌ) කාඩ්පත් හිමියා - යන්නෙන් බැංකුව විසින් කාඩ්පතක් නිකුත් කරන ලද ගිණුම්හිමියෙකු අදහස් වේ.

(එ) කාඩ්පත් භාවිත කිරීමේ සීමාව - යන්නෙන් වෙළෙන්දන්ගේ අලෙවි කිරීමේ පර්යන්තවල (POS Terminals) කාඩ්පත් හිමියා විසින් භාවිත කළ හැකි එක් කාඩ්පතකට එක් දිනයක් තුළ බැංකුව විසින් බලය පවරනු ලැබුවාවූ සීමාව අදහස්වන අතර ඒ. ටී. එම්. යන්ත්‍රයකින් ලබාගත හැකි බලය පවරන ලද මුදල් සීමාවද අදහස් වේ.

(ඒ) වෙළෙන්දන් - යන්නෙන් මාස්ටර්කාඩ් කාඩ්පත් භාරගනු ලබන්නාවූද නැතහොත් භාණ්ඩ මිලදී ගැනීම හෝ සේවා සැපයීම සඳහා මුදල් ගෙවීමේ සාධන පත්‍රයක් ලෙස මාස්ටර්කාඩ් කාඩ්පත් භාරගැනීමට කැමැති වන්නාවූද කවර හෝ ස්වභාවයක පිහිටි ආයතන අදහස් වේ.

(ඔ) විදේශීය ගනුදෙනු - යන්නෙන් ශ්‍රී ලංකාවෙන් පිටතදී සිදු කරනු ලබන ගනුදෙනු අදහස් වේ.

(ඕ) පින් (PIN) - යන්නෙන් කාඩ්පත සමග භාවිත කිරීම සඳහා බැංකුව විසින් ලබාදුන් හෝ කාඩ්පත්හිමියා විසින් තෝරාගනු ලබන පෞද්ගලික හඳුනා ගැනීමේ අංකය අදහස් වේ. (Personal Identification Number)

(ක) ගනුදෙනුව - යන්නෙන් අදාළ ගාස්තු ඇතුළු කාඩ්පත භාවිත කිරීමෙන් කරනු ලබන (මුදල් ආපසු ගැනීම්, අරමුදල් මාරු කිරීම, විකුණනු ලබන අවස්ථාවේදී කරනු ලබන ගෙවීම් ආදි) යම් ගනුදෙනුවක් අදහස් වේ.

(ග) ටී පින් (T- PIN) - යන්නෙන් දුරකථනය හරහා බැංකුව විසින් කාඩ්පත් හිමියා හඳුනාගැනීම සඳහා බැංකුව විසින් දෙන ලද හෝ කාඩ්පත් හිමියා විසින්

තෝරාගනු ලැබූ දුරකථන පෞද්ගලික හඳුනාගැනීමේ අංකය අදහස් වේ.

(ච) තුන්වන පාර්ශ්වයේ සේවා සපයන්නා - යන්නෙන් කාඩ්පත හරහා ව්‍යාප්ත කරන ලද ප්‍රතිලාභ සහ/හෝ සේවා ලබාදීම සඳහා බැංකුව සම්බන්ධතා පවත්වන තුන්වන පාර්ශ්වයක් අදහස් වේ.

## 2. කොන්දේසි හා නියමයන් අදාළවීම සහ ව්‍යවස්ථාපිත අනුකූලතාව:

2.1 කාඩ්පතට අදාළව යම් තැනැත්තෙකුට බැංකුව විසින් ලබාදෙන සියලු පහසුකම් මේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන් වලට සහ බලාත්මකව පවතින හා කලින් කළ වෙනස් කළ හැකි කොන්දේසි හා නියමයන් වලටද යටත් වන අතර කාඩ්පත් හිමියා විසින් කාඩ්පත මත ඔහුගේ/ඇයගේ අත්සන තැබීමෙන් සහ/හෝ කාඩ්පත භාවිත කිරීමෙන් කාඩ්පත් හිමියා විසින් එම කොන්දේසි හා නියමයන් පිළිගත් බවට සාක්ෂි දරයි.

2.2 කාඩ්පත භාවිත කිරීමේ දී කාඩ්පත් හිමියා විසින් ශ්‍රී ලංකාවේ සියලුම නීතිවලට අදාළවද විනිමය පාලන නියෝග වලට අදාළවද සහ කලින් කල සංශෝධනය කරනු ලබන ප්‍රතිපත්ති හා නියෝග වලටද තදින්ම අනුකූලව ක්‍රියා කළ යුතු ය.

2.3 කාඩ්පත් හිමියා විසින් වාණිජ ප්‍රමාණවලින් භාණ්ඩ මිලදී ගැනීමට/ආනයනය කිරීමට හෝ ප්‍රාග්ධන ගනුදෙනුවලට කාඩ්පත භාවිත නොකළ යුතු ය.

2.4 කාඩ්පත භාවිත කිරීම මගින් විද්‍යුත් මුදල් මාරුකිරීමක් සිදු කිරීමට හෝ ඒ. ටී. එම් හරහා විදේශීය ව්‍යවහාර මුදල් ආපසු ලබා ගැනීමට අවශ්‍ය වුවහොත් එම ගනුදෙනුව විදේශ විනිමය පාලන දෙපාර්තුමේන්තුව විසින් කලින් කල නිකුත් කරනු ලබන නියෝගවලට යටත්වන අතර එය බලයලත් කාර්ය සඳහා පමණි.

2.5 විනිමය පාලක විසින් හෝ වෙනත් පාලන අධිකාරියක් විසින් කලින් කල නියම කරනු ලබන නියමයන්ට බැංකුව අනුකූලව ක්‍රියා කළ යුතු අතර ඒ අනුව ක්‍රියා කරමින් බැංකුව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති සහ නියෝග යටතේ ගනුදෙනු පිළිබඳ තොරතුරු අදාළ බලධාරීන්ට සපයනු ලැබිය යුතු ය.

2.6 ගනුදෙනු සඳහා කාඩ්පත් හිමියාගේ අවසරය ලැබුණද එසේ නැතිවුවද කාඩ්පත භාවිත කරමින් සිදු කරන ලද ගනුදෙනු සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතු අතර ශ්‍රී ලංකාවේ විනිමය පාලන නීති සහ නියෝග ඇතුළු අදාළ නීති සහ නියෝග උල්ලංඝනය කිරීම වෙනුවෙන් පැන නගින යම් දණ්ඩන ක්‍රියා මාර්ග ඇතුළු අනවසර කාඩ්පත් භාවිතය හෝ අනවසර රහස් අංක භාවිතය හෝ අනවසර ටී - පින් (T- PIN) භාවිතය මගින් සිදුවන පාඩුව හෝ අලාභය සඳහා කාඩ්පත් හිමියා විසින් බැංකුව හානිපූර්ණය කළ යුතුය.

2.7 තත් කාලයේ වලංගුව පවත්නා විනිමය පාලන නීති හෝ වෙනත් යම් ව්‍යවස්ථාපිත නියෝගයක් උල්ලංඝනය වී ඇති බවට විශ්වාස කිරීමට බැංකුවට හේතු ඇත්නම් බැංකුව විසින් සිය අභිමතය පරිදි කාඩ්පත් හිමියාට/හිමියන්ට දැනුම් දීමකින් තොරව කාඩ්පත/කාඩ්පත් අවලංගු කරනු ලැබිය හැකි ය.

2.8 කාඩ්පත භාවිත කරමින් සිදු කරන මුදල් ආපසු ගැනීමටත්, පැවරීමක් සහ/හෝ වෙනත් යම් ගනුදෙනුවකට අදාළ මුදල් ගිණුමෙන් හර කරනු ලැබිය යුතු ය. ගනුදෙනු සිදු කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයන් ගිණුමෙහි පවත්වාගෙන යායුතු බවට කාඩ්පත් හිමියාට නියම කරනු ලැබේ. ගිණුම වෙනස් කිරීමට කාඩ්පත් හිමියාට අවශ්‍ය වන්නේ නම් ඔහු/ඇය විසින් ඒ සම්බන්ධයෙන් බැංකුව වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

2.9 ගිණුම ඒකාබද්ධ ගිණුමක් වන විට කාඩ්පතක් ඉල්ලීම සඳහා එක් එක් ගිණුම් හිමියාට අයිතියක් ඇති අතර කාඩ්පත් මගින් සිදු කරනු ලබන සියලු ගනුදෙනු සඳහා ඒකාබද්ධ ගිණුම්වල සියලු ගිණුම්හිමියන් එක්ව හා වෙන් වෙන්ව වගකිව යුතු ය.

## 3. කාඩ්පත් සේවා :

කාඩ්පත ලැබුණ වහාම කාඩ්පත් හිමියා එම කාඩ්පත පිටුපස අත්සන් කළ යුතු අතර කාඩ්පතේ ඇති අත්සන ගිණුමට අදාළ ලේඛනවල ඇති අත්සනට

සමාන විය යුතු ය.

කාඩ්පත අන්සතු කළ නොහැකි ය.

4. කාඩ්පත් බෙදාහැරීම:

කාඩ්පත කුරියර් සේවාව මගින් හෝ ලියාපදිංචි තැපැලෙන් යවනු ලැබේ. නැතහොත් කාඩ්පත් හිමියා විසින් හෝ බලයලත් තුන්වන පාර්ශ්වයන් විසින් කාඩ්පත කවුන්ටරයෙන් ලබාගත හැකි ය. කාඩ්පත් හිමියා විසින් කාඩ්පත ලබාගන්නා විට ඔහු/ඇය විසින් ඔහුගේ/ඇයගේ අනන්‍යතාව පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ යුතු අතර ලබාදෙන භාරගැනීමේ ලිපිය මත අත්සන් කිරීම මගින් කාඩ්පත ලැබුණ බව පිළිගත යුතු ය. කාඩ්පත් හිමියා වෙනුවෙන් කාඩ්පත භාර ගැනිම හෝ ලබා ගැනිම සඳහා තම අභිමතය පරිදි තුන්වන පාර්ශ්වයකට බලය පවරනු ලැබිය හැකි අතර කාඩ්පත් හිමියා විසින් හෝ තමා වෙනුවෙන් බලය පවරන ලද තැනැත්තා විසින් කාඩ්පත භාරගත් වේලාවේ සිට කාඩ්පත මත වැයවන සියලු ගාස්තු සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතු ය. බැංකුව විසින් සිය අභිමතය පරිදි බැංකුව විසින් තීරණය කරනු ලබන තුන්වන පාර්ශ්වයකට හෝ කාඩ්පත් හිමියාගේ නියෝජිතයෙකුට කාඩ්පත භාරදිය යුතු ය. කාඩ්පත භාරදුන් වේලාවේ සිට ඒ මත වන සියලු ගාස්තු සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතු ය.

5. කාඩ්පත භාවිත කිරීම :

5.0.1 කාඩ්පත් හිමියා විසින් සියලු අවස්ථාවන්හිදී තම රහස් අංකය (Pin number) හෝ ටී - පින් අංකය (T-Pin) රහසිගතව සහ කාඩ්පතින් දුරස්කර තැබිය යුතු අතර කාඩ්පත ආරක්ෂිත ස්ථානයක තැබීමටත් වෙනත් තැනැත්තෙකුට භාවිත කිරීමට ඉඩ නොදීමටත් කාඩ්පත් හිමියා වග බලා ගත යුතු ය. තවද කාඩ්පත් හිමියා දැනුවත්ව හෝ නොදැනුවත්ව තම රහස් අංකය (Pin number) හෝ ටී - පින් අංකය (T-Pin) යොදාගෙන කාඩ්පත මත වැයවන සියලු ගාස්තු සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතු ය.

5.0.2 කාඩ්පත භාවිත කර ලබාගත හැකි මුදලේ සීමාව බැංකුව විසින් සිය අභිමතය පරිදි අඩු කිරීම හෝ වැඩි කිරීම කරනු ලැබිය හැකි අතර කාඩ්පත් භාවිතයේ සීමාව වෙනස් කිරීම හේතුකොටගෙන කීර්ති නාමයට පාඩුවක් සිදුවන්නේ නම් ඒ සඳහා බැංකුව වගකියනු නොලැබේ.

5.0.3 කාඩ්පතේ මුද්‍රණය කර ඇති මාසයේ අවසාන දිනයේ දී හෝ එදිනට පෙර පමණක් කාඩ්පත භාවිත කළ හැකි ය.

5.0.4 කාඩ්පත් හිමියා විසින් ලිඛිතව සහ පටහැනිව දැනුම් දෙනතුරු අළුත් කළ සහ/හෝ ප්‍රතියෝජනය කළ කාඩ්පත් බැංකුවේ අභිමතයට යටත්ව චක් චක් කාඩ්පත් හිමියා වෙත නිකුත් කරන ලෙස කාඩ්පත් හිමියා විසින් ස්ථාවර ඉල්ලීමක් කර ඇති බවට කාඩ්පත් හිමියා එකඟ වේ. කාඩ්පතේ කාලය ඉකුත් වීමේ දි කාඩ්පත නැතිවීමේ දී ඊට අලාභහානි සිදුවීමේ දි හෝ කාඩ්පත සොරකම් කරනු ලැබීමේ දී කාඩ්පත අළුත් කිරීමේ පරම අයිතිය බැංකුව තබා ගනී.

5.0.5 කාඩ්පත සහ බැංකුවට අදාලව ගනුදෙනු කිරීමේ දී සියලු අවස්ථාවන්හිදී සද්භාවයෙන් ක්‍රියා කිරීමට කාඩ්පත් හිමියා එකඟ වේ.

5.1 ඒ ටී එම් භාවිතය :

5.1.1 කාඩ්පත බැංකුවේ ඒ ටී එම් යන්ත්‍ර හරහා සහ මාස්ටර් කාඩ් මයිස්ට්‍රෝ සහ සිරස් යන ඒ ටී එම් ජාල හරහා ලොව පුරා සහ වෙනත් බැංකුවල ඒ ටී එම් යන්ත්‍ර හරහා භාවිත කළ හැකි ය.

5.1.2 ආරක්ෂිත පියවරක් වශයෙන් කාඩ්පත් හිමියා වෙත නිකුත් කරනු ලබන කාඩ්පත් මුලදි අක්‍රීයව පවතින අතර කාඩ්පත ඒ ටී එම් යන්ත්‍ර හරහා ගනුදෙනු කිරීම සඳහා කාඩ්පත් හිමියා විසින් බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානයට (Call Centre) ඇමතුමක් ලබා දිය යුතු ය.

5.1.3 බැංකුව විසින් නිකුත් කරන ලද රහස් අංකය (PIN) කාඩ්පත් හිමියා විසින් භාවිත කරන්නේ නම් මිස , ඒ ටී එම් යන්ත්‍රවලින් මුදල් ලබා ගැනීමට කාඩ්පත් හිමියාට නොහැකි වේ.

5.1.4 බැංකුව විසින් සිය අභිමතය පරිදි ඒ ටී එම් හරහා මුදල් ගනුදෙනු කිරීමේ පහසුකම සහ සියලු වර්ගවල ගනුදෙනු සඳහා මුදල් හුවමාරු කිරීමේ පහසුකම් තාවකාලිකව අත්හිටුවීම හෝ ස්ථිරව අවසන් කිරීමටද ඒ ටී එම්

හරහා දිනකට සිදු කරනු ලබන මුදල් මාරු කිරීම්, මිලදී ගැනීම් සහ මුදල් ආපසු ලබා ගැනීමේ උපරිම සීමාවන් වෙනස් කිරීමේ අයිතියද බැංකුව තබා ගනී.

5.1.5 බැංකුවේ ඒ ටී එම් හරහා හැර කාඩ්පත්හිමියා විසින් සිදු කරනු ලබන මුදල් ආපසු ගැනීම් තත්කාලයේ බලපවත්නා ගාස්තු ක්‍රමය අනුව මුදල් ආපසු ගැනීමේ ගාස්තුවකට යටත් කරනු ලබන අතර එකී මුදල් ගිණුමට හර කරනු ලැබේ.

5.1.6 බැංකු ඒ ටී එම් හරහා සිදු කරනු ලබන සියලු මුදල් ආපසු ගැනීම් සඳහා එසේ මුදල් ආපසු ලබා ගන්නා අවස්ථාවේ දී ඒ ටී එම් යන්ත්‍ර මගින් නිකුත් කරනු ලබන යම් ප්‍රකාශයක් බැංකුව විසින් වෙනස් කරනු ලැබුවහොත් මිස අවසානාත්මක වන්නේ ය. එවැනි යම් වෙනස් කිරීමක්ද අවසානාත්මක වන අතර එසේ වෙනස් කරන ලද මුදලින් කාඩ්පත් හිමියාද බැඳී සිටින්නේ ය.

5.1.7 කාඩ්පත හෝ ඒ ටී එම් යන්ත්‍රය වැරදි ලෙස ක්‍රියාත්මකවීම හෝ අක්‍රියවීම හෝ ඒ ටී එම් යන්ත්‍රයේ ප්‍රමාණවත් මුදල් නොතිබීම හේතුකොටගෙන පැන නගින හෝ සිදුවන යම් පාඩුවක් හෝ අලාභයක් සඳහා කාඩ්පත් හිමියා විසින් බැංකුව වගකීමකට යටත් කරනු නොලැබිය යුතු ය.

5.1.8 බැංකුව විසින් සිය අභිමතය පරිදි කාඩ්පත භාවිත කරමින් ඒ ටී එම් යන්ත්‍රය හරහා මුදල් ආපසු ගැනිමේ සීමාව සීමා කළ හැකි අතර කාඩ්පත් හිමියාට මුදල් ආපසු ලබා ගැනිමට හැකිවනුයේ එම සීමාවට යටත්ව පමණි.

## 5.2 වෙළඳ භාවිතය :

5.2.1 කාඩ්පත ලොව පුරා වලංගු වන අතර එය විද්‍යුත් මාර්ගයෙන් පමණක් භාවිත කළ හැකි ය. තවද එම කාඩ්පත වෙළඳුන් විසින් භාරගනු ලබන්නේ විද්‍යුත් අලෙවි පර්යන්ත යන්ත්‍රයක් (Point of sale swipe terminal) ඇති වෙළඳුන් විසින් පමණි. කෙසේ වුවද කවර හෝ හේතුවක් නිසා වෙළඳුන් හෝ බැංකුව විසින් කවර හෝ අවස්ථාවකදි කාඩ්පත භාරගැනීමට ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය තබා ගනී. සද්භාවයෙන් යුත් පෞද්ගලික හෝ නිල කාර්ය සඳහා පමණක් කාඩ්පත භාවිත කළ හැකි අතර කාඩ්පත් හිමියාගේ ව්‍යාපාරික කටයුතුවලදි වාණිජ වශයෙන් කාඩ්පත භාවිත කිරීමට අවසර දෙනු නොලැබේ. ඇතැම් වෙළඳුන් සම්බන්ධයෙන් දරන ලද ගාස්තුවලට මිලදී ගැනිම් හා වෙනත් පහසුකම් සඳහා ගාස්තු ඇතුළත් වේ.

5.2.2 ආරක්ෂිත පියවරක් වශයෙන් නිකුත් කරන ලද කාඩ්පත ආරම්භක අවස්ථාවේ දී වෙළඳ ආයතනවල භාවිතය සඳහා අක්‍රියව පවති. වෙළඳ ආයතනවලදී ගනුදෙනු සඳහා කාඩ්පත ක්‍රියාත්මක කිරිම සඳහා කාඩ්පත් හිමියා විසින් බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය ඇමතිය යුතු ය.

5.2.3 වෙළඳ ආයතනයකදි මුදල් ගෙවීම සඳහා කාඩ්පත භාවිත කරනු ලබන විට කාඩ්පත් හිමියා විසින් වෙළෙන්දාගේ අලෙවි පත්‍රිකාව අත්සන් කර කාඩ්පත් හිමියාගේ පිටපත තමා ලඟ තබා ගත යුතු ය. සාමාන්‍යයෙන් අලෙවි පත්‍රිකාවල පිටපත් බැංකුව විසින් කාඩ්පත් හිමියාට ලබා දෙනු නොලැබේ. කෙසේ වුවද බැංකුවේ තනි අභිමතය පරිදි බැංකුව විසින් තීරණය කරනු ලබන අතිරේක ගාස්තු ගෙවීමේ දී අලෙවි පත්‍රිකා පිටපත් ලබා දිය හැකි ය.

5.2.4 අන්තර් ජාලය හරහා තැපැල් ඇණවුම් ක්‍රියාත්මක කිරීමේ පහසුකම හෝ දුරකථන ඇණවුම් මගින් මිලදී ගැනීමේ පහසුකම කාඩ්පත්හිමියාට ලබාදීමට බැංකුව විසින් එකවරම එකඟ නොවන බව කාඩ්පත්හිමියා පිළිගන්නා අතර එවැනි අවස්ථාවලදී කාඩ්පත් භාවිත කරන විට කාඩ්පත් හිමියා විසින් අලෙවි පත්‍රිකා අත්සන් නොකරයි. එවැනි ගනුදෙනුවක් සම්බන්ධයෙන් වන යම් ආරවුලක් කාඩ්පත්හිමියා සහ අදාළ වෙළෙන්දා අතර ඇතිවන ආරවුලක් වන අතර එය එම පාර්ශ්ව දෙක විසින් විසඳාගත යුතු ය. ඒ සඳහා කවර ආකාරයකින් හෝ බැංකුව වගකිව යුතු නොවේ.

5.2.5 කාඩ්පත පිළිගැනීම යම් වෙළෙන්දෙකු විසින් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් බැංකුව කිසිඳු වගකීමක් භාර නොගනි.

5.2.6 භාණ්ඩ/සේවා මිලදී ගැනිම සහ භාණ්ඩ/සේවා අවලංගු කිරිම සඳහා පසුව ණය ලබාදීම යනුවෙන් වශයෙන් වු ගනුදෙනු දෙකකි. අදාළ වෙළෙන්දාගෙන් ලැබුණ විට ආපසු ගෙවන මුදල (අවලංගු කිරීමේ ගාස්තු අදාළ වන්නේ නම් එය අඩුකර) ගිණුමට බැර කරනු ලැබේ. මුදල් ආපසු ගෙවීමේ දින 30 ක් ඇතුළත ණය මුදල ගිණුමට බැර කරනු නොලැබුණහොත් කාඩ්පත් හිමියා වෙත වෙළෙන්දාගෙන් ලැබුණ ණය සටහනේ පිටපතක් ද සහිතව

කාඩ්පත් හිමියා විසින් බැංකුව දැනුවත් කළ යුතු ය.

5.2.7 වෙළෙන්දා සමග කරනු ලබන ගනුදෙනු ගිණුමට හර කිරීම මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. ගනුදෙනුව සඳහා මුදල් ගෙවීමට ප්‍රමාණවත් මුදල් ගිණුමේ නැති නම් කාඩ්පත් හිමියාගේ වෙනත් ගිණුමකට සම්බන්ධ කිරීම සඳහා වූ පහසුකමක් (sweep in sweep out facility) කාඩ්පත් හිමියා විසින් විශේෂයෙන් තෝරාගෙන නැත්නම් කාඩ්පතට සම්බන්ධ කර ඇති වෙනත් ගිණුම්වල එකතුව වශයෙන් අවශ්‍ය මුදල තිබුණද බැංකුව විසින් එම ගනුදෙනුව සඳහා මුදල් නොගෙවනු ඇත.

5.2.8 බැංකුව විසින් සිය පරම අභිමතය පරිදි කාඩ්පත් හිමියාගේ කාඩ්පත් භාවිත කිරීමේ සීමාව සීමා කරනු ලැබිය යුතු අතර වෙළෙන්දෙකුගෙන් භාණ්ඩ මිලදී ගැනීමේ දී කාඩ්පත් හිමියා විසින් කාඩ්පත් භාවිත කිරීමේ සීමාව දක්වා පමණක් කාඩ්පත් භාවිත කරනු ලැබිය හැකි ය.

## 6. කාඩ්පත විදේශ රටවලදී භාවිත කිරීම :

වෙළඳ ආයතන සමග ගනුදෙනු කිරීම සඳහා ජාත්‍යන්තර වශයෙන් වලංගු වන අතර එය භාවිත කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අවශ්‍ය අවසරය ලබාගැනීමෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමයන්ට අනුව ක්‍රියා කිරීමටත් කාඩ්පත් හිමියා භාරගනී.

## 7. කාඩ්පතක් දැරීමට කාඩ්පත්හිමියාට ඇති සුදුසුකම :

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) නියෝගවලට සුදුසුකම් ලැබීමේ නිර්ණායක යටතට වැටෙන කාඩ්පත් හිමියෙකු විසින් කාඩ්පතක් දැරීම සහ/හෝ භාවිත කිරීම කල හැකි ය. කාඩ්පත් හිමියෙකු විසින් සිය කාඩ්පත ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) නියෝගවල සඳහන් කාර්ය සඳහා පමණක් කාඩ්පත භාවිත කළ යුතු ය. එම නියෝග කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකි ය. ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) නියෝග අනුව සහ/හෝ මාර්ගෝපදේශ අනුව පසු අවස්ථාවක කාඩ්පත් හිමියා කාඩ්පත දැරීමට නුසුදුස්සෙකු වන අවස්ථාවක ඔහු/ඇය විසින් වහාම කාඩ්පත අවලංගු කර එය බැංකුවට භාරදිය යුතු ය.

## 8. විදේශ ව්‍යවහාර මුදලින් ගනුදෙනු කිරීම :

8.1 ශ්‍රී ලංකා රුපියල් හැර වෙනත් විදේශීය ව්‍යවහාර මුදලකින් සිදු කරනු ලබන ගනුදෙනු බැංකුව විසින් තීරණය කරනු ලබන විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කර ගිණුමට හර කරනු ලැබේ.

8.2 විදේශ ව්‍යවහාර මුදල් සඳහා බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන විනිමය අනුපාතය භාවිත කරමින් බැංකුව විසින් විදේශ ව්‍යවහාර මුදල් බිල්පත් සැකසීමේ මුදල්වලට (Billing Curruncy) පරිවර්තනය කරනු ලැබේ. සියලු විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සම්බන්ධයෙන් පරිවර්තනය කරන ලද මුදලට පරිවර්තන සාධකයක් එකතු කරනු ලැබේ.

## 9. කාඩ්පත්වල කාලය අවසන් වීම :

කාඩ්පතේ මුද්‍රණය කර ඇති කාලය ඉකුත්වීමේ දිනය දක්වා සහ/හෝ ගිණුම වසා දමනතුරු කාඩ්පත් වලංගු වේ. කාඩ්පත අළුත් කිරීම 5.0.4 වගන්තියේ විධිවිධාන සළසා ඇති පරිදි සිදු විය යුතු ය.

## 10. කාඩ්පත බැංකුවේ දේපළක් ලෙස පවතී :

කාඩ්පත සියලු අවස්ථාවන්හිදී බැංකුවේ දේපළක් ලෙස පවතින අතර බැංකුවේ ඉල්ලීම මත කොන්දේසි විරහිතව සහ වහාම කාඩ්පත බැංකුවට ආපසු භාරදිය යුතු ය.

## 11. ගාස්තු සහ අයකිරීම් :

11.1 කාඩ්පත භාවිත කරනු ලබන විට බැංකුව විසින් නියම කරනු ලබන ලියාපදිංචි ගාස්තුවක් බැංකුවේ ඉල්ලීම මත බැංකුවට ගෙවීමට කාඩ්පත් හිමියා එකඟ වේ.

11.2 කාඩ්පත භාවිතය සඳහා වාර්ෂිකව ගාස්තුවක් ගෙවිය යුතු අතර බැංකුව විසින් කාඩ්පත් හිමියාට දැනුම්දෙනු ලබන අනුපාත අනුව එකී ගාස්තුව ගිණුමට හර කරනු ලැබේ.

11.3 කාඩ්පත විදේශීය ලිපිනයකට කුරියර් සේවාව මගින් යවනු ලබන විට බැංකුව විසින් යැවීමේ ගාස්තුවක් ගිණුමට හර කරනු ලැබේ.

11.4 පවත්නා ගාස්තු අනුප්‍රමාණ අනුව කාඩ්පතට අදාළ වෙනත් ගාස්තු කලින් කල ගිණුමට හර කරනු ලැබේ.

11.5 බැංකුව විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණයන් අනුව සැකසීමේ ගාස්තුවක්, තැපැල් ගාස්තු වලට අමතරව කාඩ්පත් හිමියාගෙන් ගිණුමෙන් හර කරනු ලැබේ.

11.6 කාඩ්පත් හිමියාගේ ඉල්ලීම පරිදි ඉටු කරනු ලබන යම් අතිරේක සේවාවන් සඳහා යම් ගාස්තුවක් අයකර එම ගාස්තුව ගිණුමෙන් හර කිරීමේ අයිතිය බැංකුව තබා ගනී.

11.7 කලින් කල බැංකුව විසින් ලබාදෙන ගාස්තු අඩු කිරීමක් හෝ නිදහස් කිරීමක් බැංකුවේ අභිමතය පරිදි කවර හෝ අවස්ථාවකදී බැංකුව විසින් ඉල්ලා අස්කර ගැනීම හෝ සීමා කිරීම කරනු ලැබිය හැකි ය.

11.8 පෙට්‍රල්, ඩීසල්, ගෑස් සහ ශ්‍රී ලංකාවේ ඉන්ධන අලෙවිසැල්වල ඇති වෙනත් සැපයුම් මිලදී ගැනීමේදී ඒ සඳහා සැකසීමේ ගාස්තුවක් (handling fee) අයකරනු ලබන අතර එකී මුදල බැංකුව විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණයකට අනුව ගිණුමට හර කරනු ලැබේ.

11.9 කාඩ්පත භාවිත කරමින් ගුවන් ටිකට්පතක් වෙන් කරනු ලබන විට (අදාළවන) යම් අතිරේක ගාස්තුවකට යටත්ව ගුවන් ටිකට්පත මිලදී ගැනීම සඳහා කාඩ්පත හරහා ගෙවීම් කිරීමට කාඩ්පත් හිමියාට නියම කරනු ලබන අතර එකී මුදල ගිණුමට හර කරනු ලැබේ. කාඩ්පත් හිමියා පසු අවස්ථාවක ගුවන් ටිකට්පත අවලංගු කරන අවස්ථාවකදී වෙළෙන්දාගේ අවලංගු කිරීමේ ප්‍රතිපත්තියට යටත්ව කාඩ්පත් හිමියාට යම් මුදලක් ආපසු ලැබීමට නියම වන අවස්ථාවකදී කාඩ්පත් හිමියාගෙන් බැංකුවට ඉල්ලීමක් ලැබුණ විට සහ වෙළෙන්දාගෙන් බැංකුවට මුදල් ලැබුණ විට අවලංගු කිරීමේ ගාස්තු අඩු කිරීමෙන් පසු ඉතිරිවන මුදල ගිණුමට බැර කරනු ලැබේ.

11.10 ගනුදෙනුවක් සම්බන්ධයෙන් වෙළෙන්දෙකු විසින් අය කරනු ලබන යම් අධිභාරයක්, කොමිස් මුදලක් සහ/හෝ ගාස්තුවක් සඳහා බැංකුවේ පරම අභිමතය පරිදි ගිණුම හර කරනු ලැබේ.

## 12. ආරවුල් :

12.1 18.1 සහ 18.2 වගන්තිවල සඳහන් පරිදි කාඩ්පත නැති වී හෝ සොරකම්කර ඒ බව නිසි පරිදි බැංකුවට දන්වා ඇති අවස්ථාවලදී හැර වෙළෙන්දෙකුගෙන් ලැබුණ යම් අලෙවි පත්‍රිකාවක් හෝ වෙනත් ගෙවීම් ඉල්ලීමක් එම ගෙවීම් ඉල්ලීමේ සඳහන් මුදල වෙළඳ ආයතනයට දැරීමට සිදු වූ බවට අවසානාත්මක සාක්ෂියක් විය යුතු ය. කාඩ්පත වංචනික ලෙස භාවිත කර ඇති බවට ඔප්පු කිරීමේ භාරය කාඩ්පත් හිමියාගේ වගකීමකි.

12.2 මෙම වගන්තියේ සඳහන් අලෙවි පත්‍රිකාවට විවිධ හෝටල් ගාස්තු වැනි වෙළඳ ආයතනයකදි කාඩ්පත භාවිත කරමින් කාඩ්පත් හිමියාට දැරීමට සිදු වූ අවසරලත් වියදම්වලට අදාළ සියළු ගෙවීම් ඇතුළත් වේ. කාඩ්පත් හිමියා විසින් වියදම් කරන ලද මුදලේ ප්‍රමාණය සම්බන්ධයෙන් එම අලෙවි පත්‍රිකාව මත තබා ඇති කාඩ්පත් හිමියාගේ අත්සන සහ එහි සටහන් කර ඇති කාඩ්පත් අංකය බැංකුව සහ ගනුදෙනුකරු අතර අවසානාත්මක සාක්ෂියක් වන අතර කාඩ්පත් හිමියා සෑහීමට පත්වන පරිදි මිලදි ගත් භාණ්ඩ/මිලදී ගැනිමට ඇති භාණ්ඩ කාඩ්පත් හිමියාට යථා පරිදි ලැබුණ බවට නැතහොත් අදාළ සේවාව ලබාගත් බවට සහතික විය යුතු බවට බැංකුවට නියම කරනු නොලැබේ.

12.3 ගිණුම් ප්‍රකාශයක් සහ/හෝ එස් එම් එස් පණිවුඩයක් මගින් කාඩ්පත භාවිත කිරීමෙන් සිදු කරන ලද සියලු ගනුදෙනු පිළිබඳව කාඩ්පත් හිමියාට දැනුම් දෙනු ලැබිය හැකි ය. එස් එම් එස් හරහා කාඩ්පත් හිමියාට දැනුම් දුන් ගනුදෙනුව සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා එකඟ නොවන්නේ නම් එස් එම් එස් පණිවුඩය ලැබී පැය 24 ක් ඇතුළත කාඩ්පත් හිමියා ඒ බව බැංකුවට

දැනුම් දිය යුතු අතර ගිණුම් ප්‍රකාශයක සඳහන් ගනුදෙනුවකට කාඩ්පත් හිමියා එකඟ නොවන්නේ නම් ගිණුම් ප්‍රකාශය සකස් කළ දින සිට දින 20 ක් ඇතුළත ඒ බව බැංකුවට දැනුම් දිය යුතු ය. කාඩ්පත් හිමියා විසින් එසේ දැනුම් දීමට අපොහොසත්වීම මගින් ගිණුමේ දෝෂ සහ ගිණුම් ප්‍රකාශ සම්පූර්ණයෙන් නිවැරදි බවට සළකනු ලැබේ. කාඩ්පත් හිමියකුගෙන් එකඟ නොවීමේ දැන්වීමක් ලැබුණ විට ගිණුම් ප්‍රකාශයේ සඳහන් අදාළ ගනුදෙනුව පිළිබඳව අතෘප්තියට පත් කාඩ්පත් හිමියා එකඟ නොවීම පිළිබඳ ප්‍රශ්නය විසඳීමට බැංකුව විසින් සද්භාවයෙන් සහ වාණිජමය වශයෙන් සාධාරණ වන උත්සාහයක් ගනු ඇත. එවැනි උත්සාහයකින් පසු ගිණුම් ප්‍රකාශයේ සඳහන් ගනුදෙනුව නිවැරදි බවට බැංකුව තීරණය කරන්නේ නම් බැංකුව විසින් ඒ බව කාඩ්පත් හිමියාට දැනුම්දී අලෙවි පත්‍රිකාවේ (sales slip) හෝ මුදල් ගෙවීම් ඉල්ලා සිටීමේ පත්‍රිකාවේ (payment requisition) පිටපත්ද ඒ සමඟ යවනු ලැබිය යුතු ය.

12.4 ආරවුලකට තුඩුදුන් ගනුදෙනු හේතුකොට ගෙන ගෙවීමට සිදුවන ආපසු ගෙවීම් හෝ ප්‍රතිගමනය ඇතුළු ගනුදෙනුවක් අවලංගු කිරීමෙන් හෝ ප්‍රතිගමනය කිරීමෙන් සිදුවන විනිමය පාඩුවක් සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතු වේ.

## 13. කාඩ්පත අගරු කිරීම :

කාඩ්පත යම් විශේෂිත වෙළෙන්දෙකු විසින් පිළිගනු ලබන බවට බැංකුව විසින් කිසිඳු සහතිකයක් නොදෙන අතර කාඩ්පත පිළිගැනීම යම් වෙළෙන්දෙකු විසින් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් බැංකුව කිසිඳු වගකීමක් භාරනොගනී.

## 14. නම සහ ලිපිනය වෙනස්වීම :

කාඩ්පත් හිමියාගේ නම හෝ ලිපිනයේ යම් වෙනසක් සිදුවුවහොත් කාඩ්පත් හිමියා විසින් ඒ බව බැංකුවට ලිඛිතව දැනුම් දිය යුතු ය.

## 15. භාණ්ඩ හා සේවාවල ගුණාත්මකභාවය :

ගනුදෙනුකරු විසින් සිදු කරන ලද තැපැල් ඇණවුමකින් භාණ්ඩ භාරදීමේ ප්‍රමාදයක් සිදුවීම භාණ්ඩ භාරනොදීම භාණ්ඩ නොලැබීම හෝ දෝෂ සහිත භාණ්ඩ ලැබීම ඇතුළු කාඩ්පත් හිමියා විසින් වෙළෙන්දාගෙන් මිලදී ගත් හෝ ලබාගත් වෙළඳ භාණ්ඩ ඇප සහතික හෝ සේවා සඳහා කවර ආකාරයකින් හෝ බැංකුව වගකිව යුතු නොවේ. කාඩ්පත් පහසුකම හුදෙක්ම කාඩ්පත් හිමියාට භාණ්ඩ මිලදී ගැනීම හෝ සේවා ලබා ගැනීම සඳහා වූ පහසුකමක් බවත් භාණ්ඩ හෝ සේවාවල ගුණාත්මක භාවය ප්‍රමාණය භාරදීම හෝ නොදීම සම්බන්ධයෙන් බැංකුව වගකීමක් නොදරන අතර කිසිඳු නියෝජනයක්ද ඉදිරිපත් කරනු නොලබයි. එවැනි ආරවුලක් කාඩ්පත් හිමියා සහ වෙළෙන්දා අතර විසඳාගත යුතු ය. ආරවුල හෝ හිමිකම්පෑම පවතින අතරතුර කාඩ්පත් හිමියා විසින් ඉදිරිපත් කරනු ලබන විරෝධතා නොතකා ආරවුලක් පැවතීම හේතුකොටගෙන බැංකුවට ඇති බැඳීම්වලින් කාඩ්පත්හිමියා නිදහස් නොවේ.

## 16. වගකීම බැහැර කිරීම :

16.1 පහත සඳහන් අවස්ථාවලදී සෘජුවම හෝ අන්‍යාකාරයකින් පැන නගින යම් පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් බැංකුව කිසිඳු වගකීමකට යටත් නොවේ :-

(අ) වෙළෙන්දා විසින් සපයනු ලබන භාණ්ඩ හෝ සේවාවල ඇති යම් දෝෂයක් ;

(ආ) කාඩ්පත භාරගැනීමට හෝ පිළිගැනීමට වෙළෙන්දා විසින් ප්‍රතික්ෂේප කිරීම ;

(ඇ) යම් පරිගණක පර්යන්තයක් ඒ ටී එම් යන්ත්‍රයක් සහ/හෝ අලෙවි කිරීමේ ස්ථානයක යන්ත්‍රයක් අක්‍රීයවීම ;

(ඈ) කාඩ්පත් හිමියා හැර වෙනත් තැනැත්තෙකු විසින් ගනුදෙනු උපදෙස් ලබාදීම ;

(ඉ) කාඩ්පත ආපසු භාර දෙන ලෙස ඉල්ලා සිටිමින් යම් තැනැත්තෙකු විසින් කරන ලද ප්‍රකාශයක් හෝ එවැනි ඉල්ලීමකට අදාළව යම් තැනැත්තෙකු විසින් කරනු ලබන ප්‍රකාශයක් ;

(ඊ) බැංකුවේ නියමිත නිලධාරියා හැර වෙනත් තැනැත්තෙකුට කාඩ්පත්හිමියා විසින් කාඩ්පත භාරදීම ;

(උ) කාඩ්පතේ මුද්‍රණය කර ඇති කල් ඉකුත්වීමේ දිනයට පෙර කාඩ්පත ආපසු භාරදෙන ලෙස හෝ ලබාදෙන ලෙස කරනු ලබන ඉල්ලීම බැංකුව විසින් සිදු කළද නැතහොත් බැංකුවේ නියෝජිතයෙකු විසින් සිදු කළද එසේ ඉල්ලා සිටීමට බැංකුවට ඇති අයිතිය බැංකුව විසින් ක්‍රියාත්මක කිරීම ;

(ඌ) කාඩ්පත අවලංගු කිරීමට හෝ අවහිර කිරීමට බැංකුවට ඇති අයිතිය බැංකුව විසින් ක්‍රියාත්මක කිරීම ;

(එ) කාඩ්පත භාවිත කිරීමේ සීමාව වෙනස් කිරීමේ අයිතිය බැංකුව විසින් ක්‍රියාත්මක කිරීම ;

(ඒ) කාඩ්පත ආපසු භාරදෙන ලෙස ඉල්ලා සිටීම මගින් හෝ කාඩ්පත පිළිගැනීමට හෝ භාරගැනීමට වෙළෙන්දා විසින් ප්‍රතික්ෂේප කිරීම මගින් බැංකුව විසින් කාඩ්පත් හිමියාට සිදු කරනු ලැබූ බව කියනු ලබන කාඩ්පත් හිමියාගේ කීර්ති නාමයට සිදු වූ හානියක් ;

(ඔ) 19 වන වගන්තිය ප්‍රකාරව බැංකුව එළිදරව් කරන ලද තොරතුරුවල යම් වැරදි ප්‍රකාශයක් වැරදි නියෝජනයක් වරදක් හෝ අත්හැරීමක් ;

(ඕ) යම් හේතුවක් නිසා ගාස්තු ගෙවීම ප්‍රතික්ෂේප කිරීම ;

16.2 විවිධ සේවාවන් සඳහා වූ සන්නිවේදන සහ වැඩ පිළිවෙලවල් තුන්වන පාර්ශ්වයේ සේවා සපයන්නෙකු විසින් හෝ එවැනි සේවා සපයන්නෙකුගේ කොන්ත්‍රාත්කරුවන් විසින් ලබාදෙන අතර ඒ සඳහා එම තුන්වන පාර්ශ්වයේ සේවා සපයන්නා විසින් හෝ බැංකුව විසින් මුදල් ගෙවනු ලැබේ. උපරිම උත්සාහ පදනම මත සහය ලබාදෙන අතර කාලය දුර සහ ස්ථානය යන ප්‍රශ්න නිසා ලබා දීමට නොහැකි වනු ඇත. තුන්වන පාර්ශ්වයේ සේවා සපයන්නන් විසින් යෝජනා කරනු සහ/හෝ නම් කරනු ලබන රක්ෂණ වෛද්‍ය සහ/හෝ නීති වෘත්තිකයන් ඔවුන්ගේ සේවා නියුක්තයන් හෝ තුන්වන පාර්ශ්වයේ සේවා සපයන්නන්ගේ කොන්ත්‍රාත්කරුවන්ගේ සේවා නියුක්තයන් නොවේ. එම නිසා යම් රක්ෂණ, වෛද්‍ය, නීති හෝ වෙනත් සේවා ලබාදීම භාවිතය ක්‍රියා අත්හැරීම් හෝ ප්‍රතිඵල සඳහා ඔවුන් වගකිව යුතු නොවේ. ඉහත කී පාර්ශ්වයන් විසින් සපයනු ලබන සේවාවල වැඩපිළිවෙල හෝ භාවිතය සඳහා නැතහොත් එම පාර්ශ්වන්ගේ ක්‍රියා හෝ අත්හැරීම් සඳහා කවර හෝ ස්වභාවයක වගකීමක් හෝ බැඳී සිටීමක් බැංකුව භාර නොගනී.

17. තොරතුරු හෙළිදරව් කිරීම :

මෙහි මින්මතු 19 වන වගන්තියේ විධිවිධාන සළසා ඇති කරුණුවලට යටත්ව නීතිය මගින් නියම කර ඇති ප්‍රමාණයට කාඩ්පත් හිමියා සහ බැංකුව අතර ගනුදෙනු හෝ කටයුතු පිළිබඳ සියලු තොරතුරුවල රහස්‍යභාවය බැංකුව විසින් සුරකිනු ලැබිය යුතු අතර යම් ඉහත කී කරුණු නොතකා පහත සඳහන් ආයතනවලට හෝ තැනැත්තන්ට කාඩ්පත් හිමියා පිළිබඳ සහ/හෝ ගිණුම් පිළිබඳව තොරතුරු ලබාදීමට කාඩ්පත් හිමියා බැංකුවට බලය පවරයි.

(අ) ගෙවීම් පැහැර හරින යම් බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට හෝ ණය තොරතුරු කාර්යංශයකට හෝ ණය තොරතුරු කාර්යංශයක් හෝ දත්ත මූල්‍යශ්‍රයක් පවත්වාගෙන යන පොදු සේවා සපයන්නෙකුට

(ආ) බැංකුවේ යම් සත්‍ය හෝ යෝජිත පැවරුම් ලාභියෙකුට හෝ ගිණුමකට හෝ ගිණුමට අදාළව බැංකුවේ අයිතිවාසිකම් පැවරීමේ දී සහභාගිවන්නෙකුට හෝ උප සහභාගි වන්නෙකුට ;

(ඇ) බැංකුවට හෝ අදාළ සමාගමකට රහස්‍යභාවය පිළිබඳ කාර්ය භාරයන් යටතේ වූ යම් නියෝජිතයෙකුට කොන්ත්‍රාත්කරුවෙකුට හෝ සේවා සපයන්නෙකුට

(ඈ) යම් අධීක්ෂණ හෝ නියාමන අධිකාරයකට ;

(ඉ) ශ්‍රී ලංකාවේ නීතිවලට අනුකූලව තොරතුරු සැපයීමට අණ කරනු ලැබූ යම් තැනැත්කෙුට ;

(ඊ) වාණිජ භාවිතය සඳහා බැංකුව හා ආශ්‍රිත යම් සමාගමක කාර්යාලයකට හෝ ශාඛාවකට, හෝ

(උ) මාස්ටර් කාඩ් ඉන්ටර්නැෂනල් ඉන්කෝපරේට් සමාගමට හෝ එහි ආශ්‍රිත සමාගමකට හෝ මාස්ටර් කාඩ් ඉන්ටර්නැෂනල් ඉන්කෝපරේට් සමාගමේ අභිමතය පරිදි වෙනත් පාර්ශ්වයකට ;

18. නැති වූ කාඩ්පතේ වගකීම :

18.1 කාඩ්පතක් නැතිවුවහොත් හෝ සොරකම් කරනු ලැබුවහොත් කාඩ්පත් හිමියා විසින් ඒ බව වහාම ශ්‍රී ලංකාවේ පිහිටි බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානයට දැනුම් දිය යුතු ය. කාඩ්පත් හිමියා විසින් කාඩ්පත නැති වූ /සොරකම්කල ප්‍රදේශයේ පොලීසියට/නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයකට පැමිණිල්ලක් කල යුතු ය. කාඩ්පත නැතිවීම පිළිබඳව ශ්‍රී ලංකාවේ පිහිටි ඇමතුම් මධ්‍යස්ථානයට දැනුම් දෙනතුරු කාඩ්පත මත දැරීමට සිදු වූ ගාස්තු ගෙවීමට කාඩ්පත් හිමියා යටත් වන්නේ ය.

කාඩ්පත් හිමියා විසින් කාඩ්පත නැතිවීම සම්බන්ධයෙන් දුරකථනය මගින් වාර්තා කළ හැකි අතර ඉන්පසු කාඩ්පත නැති වූ බව ස්ථිර කරමින් සහ ගාස්තු ඉල්ලා නොසිටින බව සඳහන් කරන දිවුරුම් ප්‍රකාශයක පිටපතක් බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානයට යැවිය යුතු ය. එසේම ඒ සමග කාඩ්පත නැති වූ ප්‍රදේශයේ පොලීසියට/නීති ක්‍රියාත්මක කිරීමේ ආයතනයට කරන ලද පැමිණිල්ලේ පිටපතක් ද බැංකුවට යැවිය යුතු ය. බැංකුව විසින් ප්‍රමාණවත් ලෙස සොයා බැලීමෙන් පසු කාඩ්පත තාවකාලිකව අත්හිටුවනු ලැබිය යුතු ය. නැතහොත් අවහිර කරනු ලැබිය යුතු ය (Block). ඒ සම්බන්ධයෙන් කාඩ්පත් හිමියාට සිදුවන යම් අපහසුතාවයක් සම්බන්ධයෙන් බැංකුව වගකියනු නොලැබේ. ශ්‍රී ලංකාවේ පිහිටි බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානයට නිසි පරිදි දැනුම් දෙනතුරු කාඩ්පත අනවසර ලෙස භාවිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ගිණුමට හර කරන ලද සියලු මුදල් ප්‍රමාණ සඳහා සහ ගිණුමට හර කිරීමට ඇති ගනුදෙනු සඳහා වන මුදල් ප්‍රමාණ සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතු ය. කාඩ්පතක් නැති වූ බව වාර්තා කිරීමෙන් පසු, පසුව එය සොයා ගනු ලැබුවද එය භාවිත නොකළ යුතු ය. එමගින් අගරු ගනුදෙනු සිදු විය හැකි බැවිනි. කාඩ්පතක් නැති වූ විට සොරකම් කරනු ලැබූ විට හෝ අලාභහානි සිදු වූ බව වාර්තා කරනු ලැබුවහොත් සහ පසුව එය සොයාගනු ලැබුවහොත් කාඩ්පත බැංකුවට භාරදීම මගින් එය අවලංගු කිරීම සඳහා කාඩ්පත් හිමියාට පමණක් වගකිව යුතු බව කාඩ්පත් හිමියා ප්‍රකාශ කර සිටී. කාඩ්පතේ සුරක්ෂිතභාවය සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතු අතර එය ආරක්ෂා කිරීම සඳහා සියලු පියවර ගත යුතු ය.

18.2 කාඩ්පත නැතිවීම සොරකම් කිරීම හෝ අනිසි භාවිතය පිළිබඳ කාඩ්පත් හිමියා සතු සියලු තොරතුරු කාඩ්පත් හිමියා විසින් බැංකුවට ලබා දිය යුතු අතර නැති වූ කාඩ්පත සොයා ගැනීමට බැංකුවට ආධාර කිරීම සඳහා අවශ්‍ය යයි බැංකුව සළකන සියලු පියවර කාඩ්පත් හිමියා විසින් ගත යුතු ය.

18.3 කාඩ්පත් නැතිවීම සම්බන්ධයෙන් මාස්ටර් කාඩ්පත් ජාලයට දැනුම්දීම සඳහා පරිපාලන ගාස්තු වශයෙන් බැංකුව විසින් ගාස්තුවක් අය කරනු ලැබිය යුතු ය.

18.4 නැතිවීමෙන් හෝ සොරකම් කිරීමෙන් පසු කාඩ්පත් හිමියාට ප්‍රතියෝජන කාඩ්පතක් නිකුත් කිරීමට බැංකුව කිසිම බැඳීමකට යටත් නොවේ. යම් ප්‍රතියෝජන කාඩ්පතක් සැකසීමේ ගාස්තුවකට යටත්වන අතර බැංකුව විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණ අනුව එකී මුදල ගිණුමට හර කරනු ලැබේ. ප්‍රතියෝජන කාඩ්පත බැංකුව විසින් තීරණය කරනු ලබන පරිදි මුල් කාඩ්පතට අදාළ කොන්දේසි හා නියමයන් මතම නිකුත් කළ යුතු ය.

18.5 රහස් අංකය (PIN) හෝ ටී - පින් අංකය (T-PIN) නැතිවුවහොත් සොරකම් කරනු ලැබුවහොත් හෝ වෙනත් පාර්ශ්වයකට හෙළි දරව් කරනු ලැබුවහොත් 18.1 සහ 18.2 වගන්තිවල සඳහන් පරිදි නැතිවීම හෝ හෙළිදරව් කිරීම පිළිබඳ තොරතුරු වහාම බැංකුව වෙත දැනුම් දිය යුතු ය.

19. කඩ කිරීම :

යම් කාඩ්පත් හිමියෙකු විසින් මේ ගිවිසුම කඩ කිරීමේ දී -

මෙම ගිවිසුමේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන් වුවද එවැනි කඩ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සෘජුවම හෝ අන්‍යාකාරයකින් බැංකුවට සිදුවන යම්

පාඩුවක් සඳහා කාඩ්පත් හිමියා විසින් බැංකුව වගකීමෙන් නිදහස් කරනු ලැබේ.

## 20 අවසන් කිරීම :

20.1 කාඩ්පත් හිමියෙකු විසින් කාඩ්පත සහ ලිඛිත දැන්වීමක් බැංකුව වෙත ඉදිරිපත් කිරීමෙන් කාඩ්පත අවසන් කරන ලෙස බැංකුවෙන් ඉල්ලා සිටිය හැකි ය.

20.2 කාඩ්පතේ කාන්දම් සහිත කොටස කැපී යන පරිදි කාඩ්පත කොටස් හතරකට කපා බැංකුවට භාරදෙනතුරු එවැනි දැන්වීමක් බලාත්මක නොවිය යුතු ය.

20.3 ඉහත කී පරිදි හැර කාඩ්පත් හිමියෙකු විසින් කාඩ්පත අවසන් නොකළ යුතු ය.

20.4 කාඩ්පත් හිමියා විසින් කාඩ්පත විනාශ කල බව සඳහන් කිරීමෙන් පසු කාඩ්පත මත ගනුදෙනු සිදු කළහොත් එම ගාස්තු කාඩ්පත අනිසි ලෙස භාවිත කිරීම නිසා ඇතිවුවද එසේ නැතිවුවද නැතහොත් බැංකුවට දැනුම් දී ඇති වුවද නැති වුවද එම ගාස්තු සඳහා කාඩ්පත් හිමියා සම්පූර්ණයෙන්ම වගකිව යුතු ය.

20.5 බැංකුව විසින් කවර හෝ අවස්ථාවකදී අවස්ථානුගත කරුණු පිලිබඳව දැන්වීම් ලබා දී හෝ ලබා නොදී බැංකුවේ පරම අභිමතය පරිදි කිසිඳු හේතුවක් නොදක්වා කාඩ්පත හෝ වෙනත් සේවාවක් අවසන් කිරීමට/ඉල්ලා අස්කර ගැනීමට නියම කරනු ලැබිය හැකි ය. මෙතෙක් ගිණුමට හර කර නොමැති හිඟ තබා ඇති ගනුදෙනු ඇති විට බැංකුව විසින් ගිණුම් හිමියා වෙත ගිණුමේ අරමුදල් ආපසු දීමට පෙර එසේ හිඟ තබා ඇති ගනුදෙනුවලට අදාළ මුදල් ගිණුමේ ශේෂයෙන් අඩු කළ යුතු ය.

20.6 බැංකුව වෙත ඇති ගිණුම වැසීමට කාඩ්පත් හිමියා තීරණය කළහොත් එම ගිණුම මත නිකුත් කළ කාඩ්පත ඉබේම අහෝසිවනු ඇත. කාඩ්පත්හිමියා විසින් කාඩ්පත භාවිත කිරීම වහාම නැවැත්විය යුතු අතර ගිණුමට අදාළ කාඩ්පත විනාශ කර ආපසු භාරදිය යුතු ය. මේ දක්වා ගිණුමට හර කර නොමැති හිඟ තබා ඇති ගනුදෙනු ඇත්නම් ගිණුම් හිමියාගේ ගිණුමේ ඇති මුදල් ආපසු ලබාදීමට පෙර හිඟතබා ඇති මුදල් ශේෂයෙන් අඩු කළ යුතු ය.

20.7 කාඩ්පත වහාම අවසන් කිරීමට බැංකුවට හිමිකම් ඇති අතර පහත දැක්වෙන සිද්ධීවලින් කවර හෝ සිද්ධියක් සිදුවීමේ දී කාඩ්පත ආපසු භාරදිය යුතු ය.

(අ) මෙහි දක්වා ඇති කොන්දේසිවලට හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත්වීම.

(ආ) බැංකුව සමග එළඹුන යම් ගිවිසුමක් හෝ එකඟත්වයක් (සම්භව්‍ය වුවද එසේ නැතිවුවද) යටතේ ගෙවීම් පැහැර හැරීම.

(ඇ) ගිණුම් හිමියා බංකොළොත්භාවයට පත්වීම බුන්වත්භාවයට පත්විම හෝ ඊට සමාන නීති කෘත්‍යයකට භාජනය වීම.

(ඈ) කාඩ්පත් හිමියා මිය යෑම.

(ඉ) ගිණුම වසා දැමීම හෝ ගිණුමේ අවම ශේෂය පවත්වාගෙන යාමට අපොහොසත්විම.

## 21. සංශෝධන :

කලින් කල මේ ගිවිසුමේ නියම (එකතු කිරීම් වෙනස් කිරීම් සංශෝධනය කිරීම් ආදේශ කිරීම් හෝ කපා හැරීම් අයිතිය ඇතුළු) සංශෝධනය කිරීම් අයිතිය බැංකුව තබා ගනී. ගිණුම් ප්‍රකාශය සමග දැන්වීමක් යැවීම මගින් හෝ ශ්‍රී ලංකාවේ පළ කරන පුවත් පතක එම සංශෝධනය පළ කිරීම හෝ බැංකුවේ හෝ බැංකු ශාඛාවේ දැන්වීමේ පුවරුවේ ද මේ හෝ බැංකු වෙබ් අඩවියේ පළ කිරීම මගින් එම සංශෝධන පිළිබඳ දැන්වීම් කාඩ්පත් හිමියාට ලබා දිය හැකි ය. සංශෝධනය පළ කිරීමෙන් පසු කාඩ්පත භාවිත කිරීමෙන් කාඩ්පත්හිමියා විසින් එම සංශෝධනය සීමා කිරීමකින් තොරව භාරගත් බවට සළකනු ලැබේ. කාඩ්පත් හිමියා එම සංශෝධනය පිළිගන්නේ නැත්නම් එම සංශෝධනය බලාත්මකවීමට පෙර අවලංගු කිරීම සඳහා කාඩ්පත බැංකුවට භාරදිය යුතු ය.

## 22. දැන්වීම් :

කාඩ්පත් හිමියාගේ සාමාන්‍ය හෝ අවසන් වරට දැන සිටි ලිපිනය වෙත පෙර ගෙවුම් තැපැල් මගින් බැංකුව විසින් දැන්වීම් යවනු ලැබිය හැකි ය. ගිණුම් ප්‍රකාශයේ කොටසක් ලෙස සඳහන් කරන ලද කාඩ්පතට අදාළ යම් තොරතුරක් හෝ දැන්වීමක් මේ ගිවිසුම යටතේ වූ දැන්වීමක් ලෙස සළකනු ලැබිය යුතු ය.

කාඩ්පත්හිමියා විසින් පෙර ගෙවීම් තැපැල් මගින් පහත දැක්වෙන ලිපිනයට යම් දැන්වීමක් යැවීම හෝ ලැබුණ බව ස්ථිර කිරීම කළ හැකි ය.

නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී එල් සී (පි කිව් 118)
තැ. පෙ. 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

කාඩ්පත්හිමියා විසින් පහත දැක්වෙන අංකය ඇමතීම මගින් බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය ඇමතිය හැකි ය.

+ 94 114 711 411

## 23. බලාත්මක කිරීමේ වියදම් :

සම්පූර්ණ හානි පූර්ණ පදනමක් මත නීතිඥ ගාස්තු සහ වෙනත් වියදම් ඇතුළු මෙම කොන්දේසි හා නියමයන් බලාත්මක කිරීමේ දි හෝ බලාත්මක කිරීමට උත්සාහ කිරීමේ දි බැංකුව විසින් දරන ලද සියලු වියදම් සම්බන්ධයෙන් කාඩ්පත්හිමියා විසින් බැංකුව හානිපූර්ණය කළ යුතු ය.

## 24. සාමාන්‍යය :

24.1 කාඩ්පත භාරගැනීමේ දි කාඩ්පත මගින් ඉටු කරනු ලබන සියලු සේවා පහසුකම් සහ ගනුදෙනු පාලනය වන බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසිවලට කාඩ්පත් හිමියා යටතේ වේ.

24.2 පක්ෂපාතභාවය පිළිබඳ වැඩ සටහන් කාඩ්පත්හිමියාට ඇත්නම් එම වැඩ සටහන්වලට අදාළ වෙන්වශයෙන් වූ කොන්දේසි හා නියමයන් වලින් එම වැඩ සටහන් පාලනය වන්නේ ය.

24.3 වෙළඳුන්ගේ වෙළඳභාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් වට්ටම් ලබා දෙන විට හෝ මිල අඩුකළ විට වෙළඳුන් විසින් කාඩ්පත භාර නොගැනීමට ඉඩ ඇත.

24.4 කවර හෝ අවස්ථාවකදී මෙම ගිවිසුම වෙනස් කර එම වෙනස් කිරීම් පිළිබඳව කාඩ්පත් හිමියාට දැනුම් දීමේ අයිතිය බැංකුව සතුව පවති. දැන්වීම් ලැබීමෙන් පසු කාඩ්පත් හිමියා විසින් දිගටම කාඩ්පත තබා ගන්නේ නම් සහ එය භාවිත කරන්නේ නම් කාඩ්පත් හිමියා විසින් වෙනස්කම් භාරගෙන ඇති බවට බැංකුව විසින් සළකනු ලැබේ. කාඩ්පත් හිමියා වෙනස් කිරීම් පිළිනොගන්නෙන් නම් ඔහු/ඇය විසින් කාඩ්පතේ කාන්දම් තීරය කැපී යන පරිදි කාඩ්පත හරස් අතට කපා කෑලි බැංකුවට භාරදීම මගින් කාඩ්පත් හිමියා විසින් මේ ගිවිසුම අවසන් කරනු ලැබිය හැකි ය. එසේ අවසන් කිරීමට පෙර සියලු අයකිරීම් සහ ගාස්තු සඳහා කාඩ්පත් හිමියා දිගටම යටත් වන්නේ ය.

24.5 ගිණුම් එකක් හෝ වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහ කාඩ්පත් භාවිතය සම්බන්ධයෙන් සුරක්ෂිතභාවය කඩවීමක් හෝ වෙනත් සැක සහිත අවස්ථානුගත කරුණක් ඇති බවට බැංකුව දන්වා සිටි විට හෝ සැක කරන විට බැංකුව විසින් සිය පරම අභිමතය පරිදි කිසිඳු වගකීමක් භාර නොගෙන යම් ගනුදෙනුවක් සඳහා බලය පැවරීම ප්‍රතික්ෂේප කළ හැකි අතර එවැනි අවස්ථාවකදි බැංකුව විසින් හැකිතාක් ඉක්මනින් කාඩ්පත් හිමියා වෙත ඒ බව දන්වනු ලැබේ.

24.6 කාඩ්පත නිකුත් කිරීම/භාවිතය/නැතිවීම සහ/හෝ රහස් අංකය (PIN) නැතිවීම හෝ ටී පින් අංකය (T-PIN) අංකය නැතිවීම නිසා පැන නගින හෝ ඒ සම්බන්ධයෙන් වූ ආනුෂංගික හෝ අන්‍යාකාරයක පාඩුවක් හෝ අලාභයක් ඇතුළු යම් පාඩුවක් හෝ අලාභයක් සඳහා බැංකුව වගකීමකට යටත් නොවේ.

## 25. නීතිය හා අධිකරණ බලය :

මෙම ගිවිසුම ශ්‍රී ලංකාවේ නීති මගින් පාලනය වන අතර ඊට අනුකූලව තේරුම් ගත යුතු ය. ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් විසින් නිකුත් කරන ලද රජයේ නියෝග අනුව හෝ උපදෙස් අනුව යම් සංශෝධනයක් අවශ්‍ය නම් මෙම ගිවිසුම ස්වයංක්‍රීයව සංශෝධනය වනු ඇත. මෙම කාඩ්පත භාවිත කළ හැකි වනුයේ වලංගු හා නීත්‍යානුකූල කාර්ය සඳහා පමණි. වෙනත් යම් කාර්යයක් සඳහා කාඩ්පත් හිමියා විසින් කාඩ්පත භාවිත කළහොත් හෝ වෙනත් තැනැත්තෙකුට කාඩ්පත භාවිත කිරීමට අවසර ලබා දුනහොත් එම භාවිතය සම්බන්ධයෙන් කාඩ්පතේ හිමියා වගකිව යුතු වන අතර එවැනි භාවිතයක ප්‍රතිඵලයක් ලෙස දරන ලද සියලු පාඩු/වියදම් කාඩ්පත් හිමියා විසින් බැංකුවට හෝ මාස්ටර්කාඩ් ඉන්ටර්නැෂනල් ඉන්කෝපරේටඩ් ආයතනයට ප්‍රතිපූර්ණය කළ යුතු ය.

## 26. පැවරීමේ කොන්දේසි:

බැංකුව විසින් මේ ගිවිසුම සම්පූර්ණයෙන් හෝ එහි යම් කොටසක් මාස්ටර්කාඩ් ඉන්ටර්නැෂනල් ඉන්කෝපරේටඩ් ආයතනයට හෝ එහි පාලන සමාගම්වලට හෝ පැවරුම්ලාභින්ට පැවරීමට කාඩ්පත් හිමියා මෙයින් කැමත්ත ප්‍රකාශ කරන අතර බැංකුව විසින් හෝ මාස්ටර් කාඩ් ඉන්ටර්නැෂනල් ඉන්කෝපරේටඩ් ආයතනය විසින් කාඩ්පත් හිමියාට දෙන ලද පැවරුම පිළිබඳ දැන්වීම් සඳහන් දිනයේ සිට මෙම ගිවිසුම බලාත්මක වේ.